# 9 ශ්‍රේණිය

## නිබ්බානං පරමං සුඛං

- බුදුදහම අදහන අප හැමදෙනාගේම පරමාර්ථය නිවන පසක් කර ගැනීමයි.
- ඔබේ පෙළ පොතේ ඇති පරිදි ඉදිබුවා හා මාළුවා ගේ උපමා කතාව තුළින් මාළුවාට කෙසේවත් ගොඩබිම පිළිබඳ අවබෝධ කළ නොහැකි පරිදි නිවන පිළිබඳ අවබෝධ කරගැනීම කෙලෙස් සහිත අපට අපහසු බව හැඟී යයි.



- නිවන යනු බුද්ධාදී මහ රහතුන් වහන්සේලාගේ අත්දැකීමයි.
- උන් වහන්සේලාගේ සසර දුක් ඇතිකරවන කාම තණ්හා පස්කම් සැපයෝගී කැමැත්ත භව තණ්හා මෙය මාගේ යැයි ගන්නා ශාස්වත දෘෂ්ඨි ද විභව තණ්හා පුනර්භවයක් නැත යන උච්ඡේද දෘෂ්ඨිය යන තෙවැදෑරුම් දෘෂ්ඨිය දුරු කළ උතුමෝ වෙති.

- තෘෂ්ණාව මුළු මනින්ම දුරු කළ බුද්ධාදී ආර්ය උතුමන් ගේ අත්දැකීම නිවනයි.
- නිවන ගැන පැහැදිලි කර ගැනීමට අප භාවිත කරන භාෂාව ප්‍රමාණවත් නැත.



- බුදු රදුන් පරමාර්ථ සත්‍යක් වූ නිවන පැහැදිලි කිරීමට සම්මුති සත්‍යක් වූ භාෂාව භාවිත කර ඇත.
- බුදුන් දම්සක් පැවතුම් සූත්‍රයේදී දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය මෙසේ දක්වා ඇත.

දුකට මුල්වන්නා වූ තෘෂ්ණාව මුළුමනින් ම නැසීමත් වේද අත් හැරීමත් වේද දුරලීමත් වේද මිදීමත් එහි නොඇලීමත් වේද එය දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි.

ඒ අනුව පුහුඳුන් මිනිස් සන්තානයේ මුල් බැස ගත් තෘෂ්ණාව සහමුලින්ම දුරලීම, ක්ෂය කිරීම නිර්වාණය වන බවයි.

තෘෂ්ණාව ඇතිතාක් සසර ගමන් කරයි. දුකට පත්වේ. තෘෂ්ණාව නැතිකර ගැනීම බුදුදහමට අනුව නිෂ්ඨාවයි. අවසානයයි. උතුම්ම සැපයයි.

තෘෂ්ණාව සසර දුකට හේතුවන එකම හේතු නොවේ. රාග, ද්වේශ, මෝහ ආදී පෙරමුණ ගත් සියලු කෙළෙස් සසර දුක් උපදවයි.



එනිසා සියලු කෙළෙස් ක්ෂය කිරීම නිර්වාණ යැයි බුදුරදුන් දේශනා කළ සේක.

- සියලු සංස්කාරයන් සංසිඳීම සියලු බැඳීම් අත්හැරීම තෘෂ්ණාව සපුරා නැති කිරීම විරාගය, නිරෝධය, නිර්වාණයයි.
- සසර පැවැත්ම ඇති කරන ස්කන්ධ ආදී සංස්කාර ධර්මයන්ගේ සංසිදිම නිර්වාණයයි.
- බුදුන් අගය කරනුයේ අඩු බලාපොරොත්තු ඇති සීමිත ආශාවන් ය. එම ජීවිත පෝෂණය කිරීම පහසුය. ලද දෙයින් සතුටු වේ. පැවැත්ම සැහැල්ලුය.
- අසීමිත ආශාවන් නැති තැනැත්තා නිවනට ළං වේ. අසීමිත ආශාවන් පසුපස හඹායන්නන් නිවනට ඉතා දුර ය.

## ප්‍රශ්න

- නිබ්බානං පරමං සුඛං යන්න කෙටියෙන් පහදන්න.
- තෘෂ්ණාවෙහි ස්වභාවය පිළිබඳ කියවෙන කෙටි ඡේදයක් ලියන්න.
- මහිච්ඡතාව යන්න පහදන්න.

W.M.M.V.